**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය -2017**

-----------------------------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යයනය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2767 දරන ණය ගිවිසුමේ ii ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග කිලෝමීටර් 62 ක් පමණ වැඩිදියුණු කිරීම පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් මගින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,728 කට සමාන එ.ජ.ඩො. මිලියන 105.60 ක් වූ අතර ඉන් රු. මිලියන 11,050 කට සමාන එ.ජ.ඩො මිලියන 85 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ එවක ක්‍රියාත්මක කරන ලද ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍ය සැපයීමේ අරමුණින් සහ එය 2017 සැප්තැම්බර් 11 අවසන් කරන ලදි.මෙම ව්‍යාපෘති දෙකම එක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයක් විසින් පාලනය කලා වුවද,2017 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්ථා අදාල ව්‍යාපෘති විසින් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2011 දෙසැම්බර් 14 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිත වූ අතර 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත්

ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබු එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා විශේෂ ඩොලර් ගිණුමට කරන ලද වියපැහැදම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති ගැලපීම් වලින් පැන නගින බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක හා අවසාන ශේෂ සහ ණය යටතේ ආපසු ගැනීම් හා විශේෂ ඩොලර් ගිණුමට කරන ලද වියපැහැදම් ව්‍යාපෘතිය නඩත්තු කරන පොත් හා වාර්තා අනුව සත්‍ය හා සාධාරණ ලෙස අනාවරණය කරනු ලැබූ බවද 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග එදිනට සතුටුදායක ලෙස සැසඳී තිබූ බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදුකරන ලදි.

(අ) ඉඩම් අත්පත් කර ගැනිමේ වියදම් දැරීම සඳහා 2014 සහ 2017 වර්ෂවලදී මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද පිළිවළින් රු.මිලියන 1281 ක් හා රු.මිලියන 237 ක අරමුදල් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දුන් ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස පෙන්වනවා වෙනුවට මූල්‍ය ප්‍රකාශණ තුළ ගෙවිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කර තිබේ.

(ආ) මූලය ප්‍රකාශණ තුළ පෙන්වන ඉඩම් අත්පත් කර ගැනීමේ පොළිය වැරදි ගිණුම්කරණ ක්‍රියාකාරකම් නිසා රු.869,382 කින් අඩු වී තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-----------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල 2017 | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 85.00 | 11,050 | 200.0 | 1.16 | 171.42 | 78.87 | 10,441.29 |
| ශ්‍රී ලංකා රජය | 20.60 | 2,678 | 84.5 | 0.57 | 84.15 | 39.43 | 5,220.21 |
| | **105.60** | **13,728** | **284.5** | **1.73** | **255.57** | **118.30** | **15,661.50** |

සිවිල් කොන්ත්‍රාත් වැඩවල මන්දගාමී ප්‍රගතිය හා දුර්වල සැලසුම් කිරීම ආදිය නිසා ණය දෙන ආයතනය විසින් ලබාදුන් මුලු ප්‍රතිපාදනයෙන් 7.20 ක ප්‍රතිශතයක් එනම් ඇ.එ.ඩො මිලියන 6.13 කට සමාන රු මිලියන 923 ක ප්‍රතිපාදන කාලපරිච්ඡේදය අවසන් වන විට ව්‍යාපෘතියට උපයෝජනය කිරීමට නොහැකි වූ අතර 2017 සැප්තැම්බර් 11 දින එම මුදල් ණය දෙන ආයතනයට ආපසු යවා තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

-----------------------------

ව්‍යාපෘති මෙහෙයුම් සැලසුමට අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයට හික්කඩුවෙන් හා අලුත්ගමින් ඍජුව සම්බන්ධ වන මාර්ග 2 ක් සහ වෙනත් මාර්ග ලෙස මාතර - ගොඩගම.කටුකුරුන්ද - නාගොඩ.,නුගේගොඩ- හෝමාගම සහ පාමන්කඩ- කැස්බෑව යන මාර්ග 4 ද ඇතුළුව කි.මී 62 ක් ඩැඩි දියුණු කිරීමට හා පුනුරුත්ථාපනය කිරීමට නියමිත විය.කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉහත මාර්ගයන් ගෙන් කි.මී 55.31 ක් පමණක් නිරමාණය කර සම්පූර්ණ කර තිබුණි.

## 3.3 ව්‍යාපෘති පරිපාලනය

----------------------------

පහත දෑ නිරීක්ෂණය කරන ලදි.

(අ) කොන්ත්‍රාත් ඇසතමේන්තු පිළියෙල කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම නිසා කොන්ත්‍රාත් 04 ක් සඳහා පිළියෙල කරන ලද පිරිවැය ඇසතමේන්තු සියයට 0.71 සිට 22.98 ක් දක්වා ප්‍රතිශත නියෝජනය වන ලෙස රු.මිලියන 4.56 සිට රු මිලියන 283 ක පරාසයක් දක්වා වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මාතර සිට ගොඩගම දක්වා මාර්ගය සංවර්ධනය හා පුනුරුත්ථාපන වැඩ ඉලක්ක කරන ලද ආකාරයටම සම්පූර්ණ කරන ලදි.එහෙත් අනෙකුත් මාර්ග දින 172 සිට දින 338 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සහිතව සම්පූර්ණ කරන ලදි.ව්‍යාපෘතිය කොන්ත්‍රාත් 3 කින් ප්‍රමාද ගාස්තු ලෙස රු මිලියන 128 ක් අඩු කර තිබුණා වුවත් ,කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමෙන් පසුව එය නැවත ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රමාණ පත්‍රය තුළ රු මිලියන 3.6 ක් මාර්ගයේ ගස් ඉවත් කිරීම සඳහා වෙන් කර තිබුණි සහ පාරිසරික බලපෑම අවම කර ගැනීම සඳහා ගස් නැවත සිටුවීමට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.එම නිසා සියළු මාර්ග සඳහා මි.මි 300 සිට මි.මි 2000 දක්වා විවිධ වට ප්‍රමාණයේ ගස් 1620 ක් ඉවත් කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු මිලියන 7.2 ක් වියදම් කර තිබුණි.කෙසේ වෙතත් පාමන්කඩ සිට කැස්බෑව මාර්ගය දිගේ ගස් 806 ක් රෝපණය කිරීම සඳහා රු මිලියන 4.48 ක් විචලතා නියෝග යටතේ ප්‍රවර්ථන වර්ෂය තුළ වියදම් කර තිබුණි.එක් ගසකට රු. 4000 සිට රු. 9667 ක් දක්වා ඉහල පිරිවැය පරාසයක් තුළ මුදල් ගෙවා තිබුණි.

## 3.4 බාහිර ක්‍රියාකාරකම්

-----------------------------

ව්‍යාපෘතියේ මූලික විෂය පථයට ඇතුලත් නොවූ ගාල්ල - බද්දේගම මාර්ගයේ ඉඩම් අත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 18.33 ක වටිනාකමක් ගෙවා තිබුණි

.

## 3.5 ඵලදායී නොවන ගනුදෙනු

--------------------------------------

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය විසින් මූලික අධියරේදී බදු නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා කොන්ත්‍රාත්කරුට 2017 දෙසැම්බර් 31 දින දක්වා එකතු කළ අගය මත බදු ලෙස රු මිලියන 218 ක් ගෙවීමට සිදු විය.

## 3.6 ඉඩම් අත්පත් කර ගැනීම

-----------------------------------------

ලබා දුන් තොරතුරු අනුව රජයට අයත් ඉඩම් කට්ටි 1535 ක් ද ඇතුළුව ඉඩම් කැබලි 7082 ක් අත්පත් කර ගානීමට නියමිත වූ අතර එයින් ඉඩම් කට්ටි 4343 ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ රු. මිලියන 1933 ක වන්දි මුදලක් ගෙවා තිබුණි.තවද ,ඒ පිළිබඳව ඉඩම් අත්පත් කර ගැනීමේ ගනැවත පදිංචි කිරීමේ කමිටුවේ තීරණ යටතේ රු. මිලියන 4134 ක අමතර ගෙවීමක් සිදු කර තිබුණි.ඊට අමතරව වන්දි ගෙවීම් අවසන් කිරීම ප්‍රමාද වීම නිසා ඒ සඳහා පොළිය ලෙස රු මිලියන 31 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි.

## 3.7 ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය අවසන් කිරීම

---------------------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු 2017 දෙසැම්බර් 31 දිනදී අවසන් වුවත්, ක්‍රියාත්මක කරවන ආයතනය විසින් අදාල වත්කම් ක්‍රියාත්මක කරන ආයතනය වෙත භාර දීමට අවශ්‍ය උපදෙස් නිකුත් කර නොතිබුණි සහ ව්‍යාපෘතිය වසා දැමීමේ අරමුණින් මූල්‍ය වාර්තා පිළියෙල කර නොතිබුණි.

.